D

## නිවේදනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද "බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන)" නැමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

රජය සහ නීතිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේදී එකඟ වී ඇති පරිදි සංශෝධන කළහොත් හෝ වගන්ති ඉවත් කළහොත් ආණ්ඩුක්රම ව්‍යවස්ථාවට අනනුකූල වගන්ති ඉවත් වන අතර මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සරල බහුතරයකින් සම්මත කළ හැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.